# දෙහිවල කරගම්පිටිය සුබෝධාරාම පැරණි විහාර මන්දිරයෙහි සිතුවම් සඳහා යුරෝපීය ආභාසය ලැබීම පිළිබඳ ප්‍රසාංගික පුරාවිද්‍යා අධ්‍යනයක්

ජී.ජී.ජී. මදුශංක[1], ඩී.ටී. හෙට්ටිආරච්චි[2], ටී.කේ. ගීසර[3], සී.එන්. සුගතසිරි[4]

මුඛ්‍ය පදඃ සුබෝධාරාම විහාරය, ප්‍රසාංගික පුරාවිද්‍යාව, යුරෝපීය ආභාෂය, සංස්කෘතිය, බිතුසිතුවම්

## හැඳින්වීම

ප්‍රසංගික පුරාවිද්‍යාව යනුවෙන් හැඳින්වෙන න්‍යායාත්මක සංකල්පීය ප්‍රවේශය 1980 දශකයේ දී පශ්චාත් සංස්ලේශිවාදයේ පියා වූ ඉයන් හොඩර් විසින් සාකච්ඡාවට ලක්කර ඇත. මෙම ප්‍රවේශය මගින් පුරාවිද්‍යාත්මක අර්ථ නිරූපණයේ දී අවධාරණයට ලක්වන වස්තුවක නියමානුකූල තේරුම හඳුනා ගැනීමටත් එය අයත් ආරම්භක සන්දර්භයන් අධ්‍යයනය කිරීම වැදගත් වන බවත් අවධාරණය කරයි. ක්‍රි.ව. 17-19 අතර කාලවකවානුව ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ යුරෝපීය බලපෑම සාමාජික, සංස්කෘතික, ආගමික සහ ආර්ථික වශයෙන් ප්‍රබලව සිදුවූ සංකීර්ණ කාල පරිච්ඡේදයක් විය. මේ අනුව පහතරට සංක්‍රාන්තික යුගයේ සිතුවම් කලාවක් හිමි දෙහිවල කරගම්පිටිය සුබෝධාරාම විහාරයේ නිර්මාණය කර ඇති සිතුවම් සඳහා යුරෝපීය සංස්කෘතික ලක්ෂණ මුසුවීම පිළිබඳව මෙහිදී මෙම ප්‍රසංගික පුරාවිද්‍යා න්‍යායෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ. පර්යේෂණ ගැටලුව ලෙස කරගම්පිටිය සුබෝධාරාම විහාරයෙහි පැරණි විහාර මන්දිරයෙහි ඇති සිතුවම් සඳහා යුරෝපීය ආභාෂය ලැබුණේ කෙසේද? යන්න ප්‍රධාන පර්යේෂණ ගැටලුව වූ අතර උප පර්යේෂණ ගැටලුව ලෙස එම සිතුවම් සඳහා එවකට පැවැති සමාජ සංස්කෘතියේ බලපෑමක් සිදුවූයේ ද? යන්න තහවුරු කර ගැනීමයි. පර්යේෂණ අරමුණ වශයෙන් කරගම්පිටිය සුබෝධාරාම විහාරයෙහි පැරණි විහාර මන්දිරයෙහි සිතුවම් කර ඇති සිතුවම් සඳහා යුරෝපීය ආභාෂය ලැබීමත් එහි ඇති සුවිශේෂීත්වය පිළිබඳව ප්‍රසංගික පුරාවිද්‍යා න්‍යායෙන් අධ්‍යයනය කිරීමත් අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙහිදී අධ්‍යයනය ප්‍රදේශය ලෙස බස්නාහිර පළාතේ දෙහිවල නගරයට ආසන්නව පිහිටා ඇති කරගම්පිටිය සුබෝධාරාම විහාරයේ පැරණි විහාර මන්දිරය තෝරා පත් කර ගන්නා ලදී. දත්ත රැස් කිරීමට භාවිතා කළ ක්‍රමවේද යටතේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනයත්, සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමයත්, ප්‍රාමාණික විද්වතුන් සමඟ සාකච්ඡා කිරීමත්, ආදී ක්‍රමවේදයන් යොදා ගැනුණි.

---

[1,2,3,4] ව්‍යවහාරික පුරාවිද්‍යා අධ්‍යයනාංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය
galwate2000@gmail.com

දත්ත විශ්ලේෂණ ක්‍රියාවලියේදී ප්‍රසංගික පුරාවිද්‍යා න්‍යායට අනුව පුරාතන කාලයට අයත් මනුෂ්‍ය ක්‍රියාවලීන්ට අදාළ පරිසරාත්මක සහ චර්යාත්මක අංශ මත අවධාරණය කිරීම සහ සිතුවම් ස්ථානගතව පැවැති පසුබිමෙහි අන්තර් සබඳතා ජාලය තේරුම් ගැනීම සිදුකරන ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙම විහාරයෙහි විහාර මන්දිරයෙහි නිර්මාණය කර ඇති සිතුවම් අතර යුරෝපීය ලක්ෂණ මුසු වූ සිතුවම් බොහොමයක් ඇත්තේ පැරණි විහාර මන්දිරය සහ ධර්මශාලාව ආශ්‍රිත වන අතර මෙහිදී නිරූපිත සිතුවම් තුළින් යුරෝපීය ආභාෂය ප්‍රමුඛ වන ලක්ෂණයක් වනුයේ යුරෝපීය ලාංඡනය සහ යුරෝපීය රාජකීයයන්ගේ ප්‍රතිරූප භාවිතයයි. මෙම සිතුවම් බොහොමයක් නිර්මාණය කර ඇත්තේ විහාරස්ථානයෙහි ප්‍රධාන දොරටුව, ද්වාර මණ්ඩපය, ප්‍රවේශ මණ්ඩපය ආදී වඩාත් සුපැහැදිලිව දෘශ්‍ය වන ස්ථානයන්ට ඉහළින් වීම විශේෂත්වයකි. කඟවේනෙකුගේ සහ සිංහයෙකුගේ රුවින් යුත් බ්‍රිතාන්‍ය ලාංඡනය සමකාලීනව වඩාත් පුළුල්ව භාවිතා වූ යටත් විජිත රාජ්‍ය ලාංඡනයකි. එමෙන්ම වික්ටෝරියා රැජිණගේ රුව විහාර මන්දිරයට ඇතුළුවන ද්වාරයෙහි ඉහළින් සිතුවම් කර තිබීම තුළින් ප්‍රබලව යටත්විජිතකරණ සංකල්පය ඉස්මතු වේ.

යටත් විජිත සමයේ පහතරට විහාර සිතුවම්වල අන්තර්ගත වූ සුවිශේෂී ලක්ෂණයක් වනුයේ බෞද්ධ සිතුවම්වල පසුබිම් දර්ශනය යුරෝපීය ලක්ෂණ සහිතව සිතුවම් කර තිබීමයි. මෙහිදී අලංකාර ලෙස සිතුවම් කර ඇති රාජ මාළිගා, අමාත්‍යවරුන්ගේ ප්‍රාසාද, සිටු මැදුරු ආදිය පමණක් නොව බුදුන් වහන්සේ වැඩ සිටි විහාර පවා අපරදිග ගෘහ නිර්මාණාංග සහිතව සිතුවම් කළ ඇති අවස්ථා බහුලය. මේ අනුව කරගම්පිටිය සුබෝධාරාම විහාරයෙහි පැරණි විහාර මන්දිරයේ සිතුවම් කර ඇති උම්මග්ග ජාතකයේ ඇති රාජ මාළිගයේ මෙම ඇතැම් ගෘහ නිර්මාණ ලක්ෂණ දැකගන්නට ලැබේ. මෙම සිතුවම් නිර්මාණය කර ඇති දකුණු ගුරුකුලයේ සිත්තරුන් (ක්‍රි.ව. 1750-1900) රාජ්‍යත්වය, ප්‍රභූත්වය සහ ධනවත්භාවය හැඟවීමේ සංකේත ලෙස මේවා භාවිතා කොට ඇති බව පෙනී යයි.

මෙම විහාර සිතුවම්හි නිර්මාණය කර ඇති සිතුවම් අතර රජවරුන්ගේ සහ සිටුවරුන්ගේ මුහුණු තුළින් කොකේසියානු ලක්ෂණ දැකගන්නට ලැබෙන බවත් මෙම විහාරයේ මහා ජනක ජාතකයේ සීවලී බිසවගේ සිතුවම අපරදිග කලාවේ මරියතුමියගේ රූප විලාශයට සමාන ආකාරයකින් නිර්මාණය කර ඇති බවත් අතර රාහුල කුමරුට බුදුන්වහන්සේ පෙන්වන යසෝදරාවගේ රුවද යුරෝපීය කාන්තාවගේ රුවකට සමාන බවත් දක්වා ඇත (sadamali, 2021).

ඇතැම් සිතුවම්වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් ලෙස බුදුසිරිත හා බැඳි ජාතක කථාවන්හි විවිධ චරිත යුරෝපීය ඇඳුම් පැළඳුම් වලින් යුක්තව සිතුවම් කර තිබීම විශේෂිත වේ. මහනුවර සම්ප්‍රදායේ භාවිතා වූ නෙළුම් මල්, පලාපෙති, සපුමල් වැනි සාම්ප්‍රදායික මෝස්තර වෙනුවට සුබෝධාරාම විහාරස්ථානයෙහි ප්‍රධාන පිළිම ගෙයට ඇතුළුවන දොරටුව වටා මිදිවැල් සහ මිදි පොකුරු

මෝස්තරයක් සිතුවම්කරණ කිරීම තුළින් එම නවීන යටත් විජිත සමයේ සමාජ සංස්කෘතිය සිතුවම් සහ මුසු වී ඇති බව පෙනී යයි. කෝට්ටේ යුගයේ සවැනි පරාක්‍රමබාහු රජු විසින් කරගම්පිටිය විහාරයේ නාථ දෙවියන් උදෙසා ඉදි කළ දේවාලය යටත් විජිත සමය තුළ පෘතුගීසීන් විසින් විනාශ කොට එහි ගල් කණු ගල්කිස්ස සාන්ත අන්තෝනි දෙව් මැදුර සෑදීමට රැගෙන ගොස් ඇත. මේ අනුව පැහැදිලි වනුයේ මෙම විහාරයේ සිතුවම් නිර්මාණය කිරීමට පෙර සිටම මෙම ප්‍රදේශය යටත් විජිත බලපෑමකට නතු වී තිබූ බවයි.

සමාලෝචනය

ශ්‍රී ලංකාවේ යටත් විජිත සමයේදී පෘතුගීසි (1505-1658) ලන්දේසී (1658-1796) ඉංග්‍රීසින් (1796-1948) යන යුරෝපා ජාතීන් විසින් ලංකාවේ පහතරට ප්‍රදේශ පිළිවෙළින් පාලනය කරන ලදි. එමෙන්ම අනුරාධපුර යුගයේ සිට අඛණ්ඩව පැවත ගෙන එන ලැබූ ලාංකීය බෞද්ධ සිතුවම් කලාව තුළ දක්නට නොලැබුණු, නමුත් යුරෝපීය කලාවෙහි ප්‍රචලිත පැවැති ඇඳුම් පැළඳුම්, ගෘහභාණ්ඩ සහ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ රැසක් යටත් විජිතකරණයේ බලපෑම හේතුවෙන් ලංකාවේ පහතරට බෞද්ධ විහාරාරාමයන්ගේ නිර්මාණය කළ ඇති සිතුවම් කලාව සමඟ මුසු වූ බව පැහැදිලි වේ. මේ අනුව සුබෝධාරාම විහාරයෙහි සිතුවම් කර ඇති සිතුවම් සඳහා යුරෝපීය ආභාෂය ලැබීමට හේතුව වුයේ එවකට පැවති සාමාජීය සහ සංස්කෘතික කාරණා නිසාවෙන් බව මෙහිදි නිගමනය කළ හැකිය.

ආශ්‍රිත මූලාශ්‍රය

නන්දන, සී. ලීලානන්ද. පි, රෝලන්ඩ්. (1990). ***ශ්‍රී ලංකා බිතුසිතුවම්-කරගම්පිටිය සුබෝධාරාමය***. කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

ජයතිලක, ඩබ්.එන්. (2023). ***යටත් විජිත දේශපාලන විෂයෙහි බෞද්ධ කලාවේ දෘශ්‍ය ප්‍රතිචාර.*** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

සෝමතිලක, එම්. (2003). ***පුරාණ ශ්‍රී ලංකාවේ බෞද්ධ සිතුවම් කලාව***. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.